

# "සොඳුරු සෙවණැලි" වෙනස්ම ආකාරයක සංගීතමය අද්දැකීමක් - රත්න ශ්‍රී

**තුෂාන් වීරරත්න**

ඕස්ට්‍රේලියාවේ මෙල්බර්න් නුවර පැවැත්වීමට නියමිත සොඳුරු සෙවණැලි වින්දනීය ප්‍රසංගය පිළිබඳව ප්‍රවීණ කලාකරු රත්න ශ්‍රී විජේසිංහ ශූරීන් සමග අපි කතා කළෙමු.

**ඒකාකාරී සංගීත ප්‍රසංග රටාවෙන් මිදුණ වෙනස්ම ආකාරයක සංගීතමය අද්දැකීමක්.. ඒ සොඳුරු සෙවණැලි ප්‍රසංගයේ තේමාව.. අපි ඒ ගැන කතා කළොත්**

- මං හිතන්නේ දැනට ඕස්ට්‍රේලියාවේ ජීවත් වෙමින් මේ උත්සවය සංවිධානය කරන නිරාෂ ගුණසේකර ඇතුළු ශ්‍රී ලාංකික සහෘද පිරිස අපේක්ෂා කරනවා ඇත්තෙ බොහෝ විට අපි දැකල තියෙන්නෙ සංගීත ප්‍රසංග කියල හුදෙක් වාදක මණ්ඩලයක් හා ගායකයෙක් මැදිහත් වී කරන ප්‍රාසාංගික අද්දැකීමෙන් එහාට ගිය යමක් කරන්න. ඔවුන් සැලසුම් කරල තියෙන්නෙ එහෙම නෙමෙයි ඊට වැඩියෙ ගීතයේ සාහිත්‍යමය පක්ෂය ගැනත් ගීතයේ සංගීතමය පක්ෂය ගැනත් තරමක් විචාරාත්මකව රසවිඳින සහෘදයින්ට උදව් කරන විදියේ කතාබහක් එක්ක මේ ප්‍රාසාංගික අද්දැකීම ලබාදෙන්න. ඒක තමයි විශේෂත්වය වෙන්නෙ.

**ලාංකීය සංගීතය කලාව ජාත්‍යන්තරයට අරන් යෑමේ උත්සාහයක් ද මේ...?**

- ඒක එහෙමම කියන්න අමාරුයි. මොකද ජාත්‍යන්තරයේ තියෙන බටහිර දැවැන්ත සංගීත කලාව ජෑස් හිපොප් වගේ ජාත්‍යන්තර ප්‍රවණතාවයන්ට අනුගත වන්න නොවෙයි මේ උත්සාහ කරන්නෙ. බොහෝ විට ශ්‍රී ලාංකීය ගීත හා සංගීතය පදනම් වෙලා තීයෙන්නෙ උත්තර භාරතීය රාගධාරී සංගිතය ඔස්සේ. එහිදී සරල ශාස්ත්‍රීය ශෛලීන් වගේම බටහිර සංගීත කොටස් ආකෘති භාවිත කරනවා. නමුත් ඒවා සංසන්දනය කරන්න අමාරුයි බටහිර ජනප්‍රිය ජෑස් පොප් වැනි සංගීත රටාවන් එක්ක. එතනදි කියන්න ඕන දේ තමයි හැම සංස්කෘතියකටම අයිතියක් තියෙනවා තමන්ගේ අනන්‍යතාවය ලෝකෙට පෙන්වන්න. ලෝකයක් බැඳිල ඉන්නවා ඒක පිළිගන්න. ඒක නිසා අපි උත්සාහ කරන්නෙ අපේම කියන සංගීත ක්‍රමයක් ඉදිරිපත් කරන්න.

**මීට කලින් ඕස්ට්‍රේලියවේ දි කරපු ප්‍රසංග හා ඒ අද්දැකීම් විස්තර කළොත්...?**

- මීට කලින් කරපු ඒ ප්‍රසංග කරේ මෙල්බර්න් හා ඇඩිලේඩ් වල. ඒක ප්‍රවීණ ශිල්පීන් සහභාගි වෙලා නෙමෙයි කළේ. එහේ ජීවත් වන ගායන ශිල්පීන්, වාදන ශිල්පීන් හා රංගන ශිල්පීන් තමයි සම්බන්ධ උනේ. එහිදී අපි ගීත වල පසුබිම හා ගීත රසවිඳින්නෙ කොහොමද කියන එක ගැන කතා කරමින් තමයි ඒ ප්‍රසංගය සිද්ධ උනේ. ඒක සාර්ථක වුණ බවක් පෙණුනා. නමුත් ඊට වඩා මෙතන දී ශ්‍රී ලාංකීය ප්‍රවීන සංගීත ශිල්පීන් දෙදෙනෙක් එනම්, විශාරද බණ්ඩාර අතාවුද හා නදීක ගුරුගේ කියන අද්දැකීම් සහිත තරුණ නිර්මාණාත්මක සංගීතකරුවා යන දෙදෙනාම සහභාගී වෙනවා. රූපවාහිනී මාධ්‍යයෙන් නදීක බොහෝ තම ශක්‍යතා පෙන්වපු කෙනෙක් . නමුත් ඊට වැඩියෙ බොහෝ දේවල් බලාපොරොත්තු වෙන්න පුළුවං මේ කලාකරුවෝ දෙන්නාගෙන් මේ මොහොතේ.

**සොඳුරු සෙවණැලි සංගීතමය අත්දැකීමේ ආකෘතිය කොහොමද...?**

- මේක ඉදිරිපත් කරන්නා වෙන්නෙ මම. ඉතිං මගේ අරමුණ මහා විශාල ශක්‍ය කරුණු කාරණා කියලා රසිකයන් වෙහෙසට පත් කිරීම නෙවෙයි. ගීත රසවිඳින්න රසිකයන්ට උදව් වෙන්න. ගීතයේ සාහිත්‍ය පක්ෂය ගීතයේ අද්දැකීම් ඒ අද්දැකිම් කොහොමද ගීතයක් දක්වා විකාශනය උනේ වැනි කාරණා ගැන මං එතනදි කතා කරන්න බලාපොරොත්තු වෙනවා. ඒ වගේම එහි සංගීතමය පසුබිම ගැන නාද ආකෘතිය ගැන නාද වලින් කොහොමද අද්දැකීම් කියන්නෙ ඒවායේ නිර්මාණාත්මක භාවිතය ගැන නදීක ගුරුගේ සංගිතවේදීයා කතා කරනවා. ඒවා අවශ්‍ය අවස්ථාවලදී ගායනා කිරීමටත් ඔහු සූදානමින් ඉන්නවා. විශාරද බණ්ඩාර අතාවුද අවුරුදු 50 ක් පමණ සංගීත අත්දැකීම් තියෙන පරිණත ශිල්පියෙක්. ඔහුත් ඔහුගෙ ගායනා ඉදිරිපත් කරනවා.

**මේ ප්‍රසංගයේදී ගිත රචකයා තමයි මේක මෙහෙයවන්නේ. ජාත්‍යන්තර ප්‍රසංගයකදී ඒ අළුත් ප්‍රවණතාවය ගැන විස්තර කළොත්...**

- ඔව්. ගීත රචකයෙක් මේ ප්‍රසංගය මෙහෙයවනකොට ඔහුට සීමාවක් පැනවෙනවා. ගීත රචකයාට අයිතියක් නෑ තමන්ගේ ගීත මහා ඉහලින් වර්ණනා කරන්න . ඒක ආචාරශිලී නෑ. නමුත් ගීතයට පසුබිම් වන අද්දැකීම් කොහොමද ඒවා ගීතයක් දක්වා විකාශනය වෙන්නෙ ඒවායේ තියෙන වැදගත්කම් මොනවාද අනිත් අයට කොහොමද ඒක විදගන්න පුළුවං වෙන්නෙ කියන කරුණු කාරණා සම්බන්ධයෙන් කතා කෙරෙන්නෙ. ඒ වගේම රසිකයන්ට ගීත විඳින්න රසාස්වාදය කරන්න මගපෙන්වීමක් කරන්න අපි උත්සාහ කරනවා.

**ඕස්ට්‍රේලියාවේ ඉන්න රසික සහෘදයන්හට දීමට ඇති පණිවිඩය සොඳුරු සෙවණැලි ප්‍රසංගය සම්බන්ධව...**

- ඔව්. මෙල්බර්න් කියන්නෙ ලංකාවට පසු වැඩිම ශ්‍රී ලාංකික පිරිසක් ජීවත් වෙන නගරය. ඔවුන්ගේ මුල් තියෙන්නෙ මෙහෙ. සංස්කෘතික අද්දැකීම් සංස්කෘතික ජීවිතය තියෙන්නෙ මෙහේ. ඔවුන් ඒවායෙන් වියෝ වෙලා ඈත් වෙලා තමයි ඉන්නෙ. ඒ නිසා ඔවුන්ට නැවත වාරයක් මව්බිමේ උණුසුම සහ සහෝදරත්වය මව්බිමේ තියෙන මානුෂික අද්දැකීම්. මේ සියල්ල මුණගස්වන්නට මේක හොඳ අවස්තාවක් වෙයි කියල අපි විශ්වාස කරනවා.

Alpha academy
Classes at Dandenong
Selective entry school exam preperation
Primary, Secondary, VCE
2015 Program
Primary & Secondary - Mathematics, Science and English
VCE - Biology, Chemistry
VCE English - Recommended Texts Analytical Writing
Classes conducted by Current School Teachers
Contact - Sarah on 0457 908 918
ABN 52267352093